**ශීර්ෂය 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව පිළිබඳව විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුලි 03 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

--------------

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

--------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,072.78 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,008.63 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 64.15 ක් හෙවත් සියයට 5.98 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 501.78 | 498.15 | 3.63 | 0.72 |
| මූලධන | 571.00 | 510.48 | 60.52 | 10.60 |
| **එකතුව** | **1,072.78** | **1,008.63** | **64.15** | **5.98** |

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 29201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 26.50 | 26.49 | 18.50 | 22.94 | 120.00 | 75.87 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දෙපාර්තමේන්තුව යටතේ වන තැන්පත් ගිණුම් 04 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂ එකතුව රු.මිලියන 22.2 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0001/0110/000 | 0.32 |
| 6000/0000/00/0013/0106/000 | 7.61 |
| 6000/0000/00/0002/0153/000 | 0.21 |
| 6000/0000/00/0016/0098/000 | 14.06 |
| **එකතුව** | **22.20** |

## 2.4 විගණන නිරීක්ෂණය

----------------------

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

-----------------------------------------------

## 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඉන් ලේඛනයක් විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|---|
| (i) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| (iii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (iv) | රාජකාරි දුරකථන ලේඛනය | මුදල් රෙගුලාසි 845(1) | පවත්වා නොතිබුණි. |
| (v) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | යාවත්කාලීන කර නොතිබුණි |

## 3.2 විසර්ජන ගිණුම

-----------------

**අයවැය විචලනය**

-------------------

වැය විෂයයන් 06 ක් සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් එකතුව රු.මිලියන 117 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා තිබුණු අතර, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින්

ඉල්ලුම් කර තිබුණු අග්‍රිම නිකුත් නොකිරීම නිසා රු.මිලියන 15.93 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 02 ක් ඉක්මවූ එකතුව රු.1,105,077 ක් වූ තැන්පතු 16 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබා දී තිබුණු රු.2,224,402 ක මුදල් අදාළ කාර්ය භාරයයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

(ඇ) විදේශ ආයතන 02 කින් හා පශු වෛද්‍ය සංගමය මඟින් ලැබුණු පිළිවෙලින් රු.2,894,933 ක හා රු.200,000 ක මුදල් අදාළ කාර්යභාරයයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවා තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය

------------------------------------------------------------------------

විෂය අංක 29201 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශනය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශනය අනුව, එදිනට අයවීම් හිඟහිට තිබුණු ණය ශේෂවල එකතුව රු.818,425 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ අය නොවී වර්ෂ 01 ක සිට වර්ෂ 19 ක් දක්වා වූ කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ආ) 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8 ඡේදය ප්‍රකාරව ලබා දෙන ලද වැටුප් ණය අත්තිකාරම්වලට අදාළ රු.3,106,806 ක පොලී වටිනාකම සාමාජික ණය ලේඛනයට ඇතුළත් කර යාවත්කාලීන කර නොතිබුණි.

(ආ) 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව සෑම මාසයක් අවසානයේදී පාලන ගිණුමේ ශේෂ සාමාජික ණය ලේඛනයේ ශේෂ සමඟ සසඳා නොතිබුණු බැවින් 2016 දෙසැම්බර් 31 දිනට ණය ශේෂයේ රු.98,125 ක වෙනසක් වී තිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත වර්ග කර ඇති පරිදි ඇතැම් වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | වත්කම් වර්ගය | ඒකක ගණන | නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවති කාලය |
|---|---|---|---|
| (i) | ඉඩම් (හෙක්ටර්යාර) | 34.41 | - |
| (ii) | ගොඩනැඟිලි | 25 | වර්ෂ 01 සිට වර්ෂ 15 දක්වා |
| (iii) | මෝටර් වාහන | 14 | වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා |
| (iv) | යන්ත්‍ර සූත්‍ර | 54 | වර්ෂ 01 සිට වර්ෂ 10 දක්වා |
| (v) | වෙනත් වත්කම් | 310 | වර්ෂ 01 ක සිට |

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2013 හා 2015 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණවලදී අපහරණය කළ යුතු වර්ෂ 3 ක සිට වර්ෂ 5 ක් දක්වා පරාසයක කාලයක සිට ක්‍රියා විරහිතව පැවැති උපකරණ 04 ක් 2017 ජනවාරි 27 දින වන විටත් අපහරණය කර නොතිබුණි.

### (ඇ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

දෙපාර්තමේන්තුව විසින් ගොඩනැඟිලි 02 ක් වර්ෂ 16 කට අධික කාලයක් මුළුල්ලේ බාහිර පාර්ශවයක් වෙත ලබා දි තිබුණි. එමෙන්ම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ඉහළ මහලේ එක් කොටසක් 2014 වර්ෂයේ සිට විදේශ ව්‍යාපෘතියක් සඳහා බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබුණි.

### (ඈ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

වෙනත් ආයතන සතුව තිබුණු ඉඩම් ඒකක 16 ක් විධිමත්ව පවරා නොගෙන දෙපාර්තමේන්තුව විසින් වර්ෂ 02 ක සිට වර්ෂ 06 දක්වා කාල පරාසයක් තුළ භාවිතයට ගෙන තිබුණි.

**3.6** අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XV පරිච්ඡේදයේ 4.3 වගන්තිය | 8,000,000 | නිලධාරීන් 04 දෙනෙකු විදේශගත වීම සම්බන්ධයෙන් වු බැදුම්කර අත්සන් කර තිබුණු ඇපකරුවන්ගේ සුදුසුකම් පරීක්ෂා කර නොතිබුණි. |
| (ii) XV පරිච්ඡේදයේ 4.4 වගන්තිය | -- | විදේශගත වූ පශු පර්යේෂණ නිලධාරියෙකු සම්බන්ධයෙන් අනිවාර්යය සේවා කාල පරිච්ඡේදයක් සඳහා වන ගිවිසුමක් අත්සන් කර නොතිබුණි. |
| (iii) XIX පරිච්ඡේදයේ 7.1 වගන්තිය | -- | 2016 ජුලි 05 වන දින ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගෙන් රජයේ නිවාස සන්තකය පවරා ගැනීමට දෙපාර්තමේන්තු ප්‍රධානියා කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| **මුදල් රෙගුලාසි 94(1)** | 14,243,978 | මූලධන වැය විෂයයන් 15 කට අදාළව සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | **රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය** | | |
| **(i)** | **5.4.8(අ) මාර්ගෝපදේශය** | 164,069 | ඇස්තමේන්තු කොන්ත්‍රාත් මුදලින් සියයට 5 ක් වන රු.813,469 ක කාර්යසාධන සුරක්ෂණ වටිනාකම වෙනුවට රු.649,400 ක කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන තිබුණි. |
| **(ii)** | **7.10 මාර්ගෝපදේශය** | 2,357,784 | කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව ඉටු කිරීමට හැකියාව හා ධාරිතාවය තිබෙන බවට ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් නිර්ණය කිරීම සඳහා පශ්චාත් සුදුසුකම් පරීක්ෂාවක් නොකර එක් කොන්ත්‍රාත්තුවක් ලබා දී තිබුණි. |
| **(iii)** | **8.14.1 මාර්ගෝපදේශය** | 269,966 | එක් කොන්ත්‍රාත්තුවක් සඳහා ගිවිසුමේ සඳහන් පරිදි ප්‍රමාද කුලී අයකර ගෙන නොතිබුණි. |

## 3.7 දේශීය මූල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති, ව්‍යාපෘති නිම නොකර අතහැර දැමීම හා ව්‍යාපෘති නිම කිරීමවල ප්‍රමාදයන් පිළිබඳ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 සහ 2015 වර්ෂවල සිදු කරන ලද කෘතිම සිංචන කටයුතුවලින් (Artificial Insemination) බිහි වූ කෘතිම සිංචන උපත් ප්‍රමාණය (Calving) සලකා බැලීමේදී සියයට 18 ක සිට සියයට 38 ක් දක්වා තරම් ඉතා පහළ මට්ටමක පැවතුණි.

(ii) **ලිංග නිර්ණය කරන ලද ආනයනික ශුක්‍රානු (Sexed semen)**

---------------------------------------------------------------

ලිංග නිර්ණය කරන ලද ශුක්‍රානු (Sexed semen) 14582 ක ප්‍රමාණයන් 2013 වර්ෂයේදී කුණ්ඩසාලේ කෘතිම සිංචන මධ්‍යස්ථානයට අමාත්‍යාංශය මඟින් ලබාදී තිබුණු අතර එයින් කෘතිම සිංචන කටයුතු වෙනුවෙන් 13911 ක් නිකුත් කර තිබුණි. ඉන් සිදුකරන ලද කෘතිම සිංචන කටයුතු (AI) පළාත් මට්ටමින් හා පෞද්ගලික ආයතනයකට නිකුත් කළ ප්‍රමාණය හා සසඳා බැලීමේදී එක් පළාතක පමණක් සියයට 60 ක ප්‍රගතියක් පැවතුණ අතර ඉතිරි පළාත්වල හා පෞද්ගලික ආයතනයේ කෘතිම සිංචන කටයුතු සියයට 7ක සිට සියයට 54 ක් දක්වා පරාසයක ප්‍රමාණවලින් අඩු මට්ටමක පැවතුණි.

(iii) ලිංග නිර්ණය කරන ලද ආනයනික ශුක්‍රානු භාවිතයෙන් කරන ලද කෘතිම සිංචන කටයුතු (AI) හා එහි කෘතිම සිංචන උපත් (Calving) පිළිබඳ සලකා බැලීමේදී, පළාත් දෙකක හා පෞද්ගලික ආයතනයක කිසිදු සාර්ථකත්වයක් ළඟාකර ගෙන නොතිබුණි. එය සමස්ථයෙන් සියයට 4 ක් වැනි ඉතා පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

**(ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

--------------------------------------

ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 3.94 ක් වූ පශු පර්යේෂණ ආයතනයේ රනිකට් එන්නත් තත්ත්ව පාලනය සඳහා කුකුළු නිවාසයක් ඉදිකිරීමේ කටයුතු 2016 අගෝස්තු 07 දින ආරම්භ කර තිබුණි. 2016 දෙසැම්බර් 31 දින වන විට ඒ සඳහා රු.මිලියන 1.12 ක් වැය කර තිබුණි. ගිවිසුම් ප්‍රකාරව ඉදිකිරීම් කටයුතු සිදු නොවීම හේතුවෙන් නැවත 2017 මාර්තු 27 දින රු.මිලියන 3.21 ක වියදම් ඇස්තමේන්තුවක් පිළියෙල කර නිර්දේශය සඳහා ඉදිරිපත් කර තිබුණි.

**(ඇ) ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්**

-------------------------------

ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 3.60 ක් වූ තෙලහැර එළු අභිජනන මධ්‍යස්ථානයේ එළු කොටු ඉදිකිරීමේ කටයුතු ගිවිසුම් ප්‍රකාරව 2016 නොවැම්බර් 28 දින අවසන් කළ යුතුව තිබුණි. ප්‍රදේශයේ පැවැති අයහපත් කාලගුණ තත්ත්වය නිසා එම ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ඉටු කිරිමට නොහැකි වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට එම ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 1.19 ක් වැය කර තිබුණි. එම ව්‍යාපෘතිය 2017 පෙබරවාරි 10 දින නිම කර තිබුණි..

**3.8 පාඩු හා හානි**

---------------

1998 පෙබරවාරි 26 දින හා 2000 මාර්තු 16 දින අනතුරට පත්වූ වාහනයක මුළු අලාභය

රු.123,950 ක් වී තිබුණි. වාහනයට සිදු වූ අලාභය අදාළ වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු නොකර, 2013 වර්ෂයේදී රු.462,999 කට වාහනය අලෙවි කර තිබුණි.

## 3.9 විසඳා නොතිබුණු විගණන ඡේද

දෙපාර්තමේන්තුවට අදාළව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවට යොමුව | | යොමුගත විෂයය |
|---|---|---|
| **වර්ෂය** | **ඡේද අංකය** | |
| 2015 | 3.8 (අ) | දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිල්ලක ඉහළ මහළය පෞද්ගලික පාර්ශවයකට ලබාදී තිබුණද 2006 දෙසැම්බර් සිට 2016 මැයි මාසය දක්වා කාලයට අදාළව රු.690,000 ක හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| 2015 | 3.8 (ආ) | ජල බිල්පත් ගෙවීමේදී මහනුවර මහ නගර සභාවට ගෙවා තිබුණු රු.304,566ක අධි මිල ගාස්තුවක් අදාළ වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 3.10 කළමනාකරණ දූර්වලතා

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) 1986 නොවැම්බර් 08 දින සිට 2012 ජූනි 21 දින දක්වා කාල පරාසය තුළ විදේශගත වූ නිලධාරීන් 09 දෙනෙකු විසින් ගිවිසුම් කඩ කිරීම හේතුවෙන් රජයට අයවිය යුතු රු.9,008,323 ක දණ්ඩන මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවට අයත් පේරාදෙණිය ගැටඹේ පශු සම්පත් දැනුම කේන්ද්‍රය පිහිටි ගොඩනැගිල්ලේ ඉහළ මහලේ කොටසක් 2004 ජූනි 01 දින සිට ජාතික පශු සම්පත් මණ්ඩලයේ ප්‍රාදේශීය කාර්යාලයක් පවත්වාගෙන යාම වෙනුවෙන් කුලියට දී තිබුණු අතර, 2006 දෙසැම්බර් මාසයේ සිට 2017 ජූනි මාසය දක්වා අයවිය යුතු රු.846,000 ක හිඟ කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 193 | 146 | 49 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 21 | 20 | 02 | 01 |
| (iii) | ද්විතියික මට්ටම | 338 | 293 | 45 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 395 | 303 | 92 | - |
| | එකතුව | 947 | 762 | 188 | 03 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවාගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව 03 ක් පිළිබඳ විධිමත් අනුමැතියක් ලබාගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

### (ආ) වෙනත් පාර්ශවයන්ට මුදාහල මානව සම්පත්

2008 මැයි 22 දින සිට 2012 ජුනි 30 දින දක්වා කාල සීමාව සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු පශු වෛද්‍ය නිලධාරිනියක් 2012 ජුලි 01 දින සිට නැවත දෙපාර්තමේන්තුවේ සේවයට වාර්තා කළ යුතුව තිබුණි. 2016 දෙසැම්බර් 14 දින සේවයට වාර්තා කර තිබුණු එම නිලධාරිනිය දැනට ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශයේ සේවයේ යෙදී සිටින බව නිරීක්ෂණය විය. 2016 ජනවාරි මාසයේ සිට 2017 මැයි මාසය දක්වා එකතුව රු.1,665,006 ක ශුද්ධ වැටුපක් ගෙවා තිබුණු අතර, එම වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.